


# වෙසක් වන්දනා

"සම්බෝලත් එක්ක කඩල හරි රසයි නේද ?" පන්හිඳ තලු මැරුවා.

"වෙලාවෙ හැටියට කියාපු දන්සැල" පින්සල සීත කබාය ගලවන ගමන් කතාවට හවුල් වුණා.

"හාමුදුරුවන්ගේ බණ ටිකත් ඒ වාගෙම තමා. කාලෙ හැටියට, දේසෙ හැටියට, දේසනා කරපු රසවත්, හරවත්, බණක් !" පින්සල පන්ගෙයි පින්ගෙයි කතාවට අලුත් අර්ථකතනයක් දුන්නා.

2600 වෙනි සම්බුද්ධ ජයන්තිය පිරුණ මේ වෙසක් සති අන්තයේ තුන්දෙනා එක්ක හොඳ රවුමක් ගිහින් ගෙට ගොඩවුණා විතරයි. ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේ සංවිධානය කරලා තිබුණ කඩල දන්සැල ගැන තුන්දෙනාගෙම හිත ඇදිලා ගිහින්. අපේ තරුණ කට්ටිය කීප දෙනෙක්ගෙ පොඩි වැඩක්. වැස්ස, සීතල තිබුණ ඒ හැන්දෑවෙ බණ අහන්න ඇවිත් උන්න හැමෝටම බඩගිනි වෙලයි තිබුණෙ. වැඩේ පුංචි වුණත් ඒ වෙලාවේ කඩල දන්සැල කරපු අය කරගත්තෙ හොඳ පිනක්. මෙහේ ඉගෙනගන්න ඇවිත් ඉන්න නිලුක දිල්හාර, මිලින්ද ගුණරත්න, ළහිරු මධුශංක, දමිත් තීක්ෂණ, ගයාන් සමරවීර, සංඛ දිනිත්‍ර දරුවො කීප දෙනාගේ මේ වැඩේට ස්විංග්බර්න් වල ඉංජිනේරු අංශයේ දරුවො කීප දෙනෙකුත් එකතු වුණා.

ඇත්තටම අපේ තුන්දෙනා එදා වෙසක් වන්දනාව පටන් ගත්තේ කීස්බරෝ ධම්මසරණ විහාරයෙන්. කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍ය සංගමය තමුන්ගේ වාර්ෂික බණ දේශනා වැඩ සටහනේ ප්‍රධාන දේශනය සංවිධානය කරලා තිබුණේ ඒ විහාරයේ. මේ වාරේ ලංකාවෙන් බණට වැඩම කරලා තිබුණේ පූජ්‍ය ගලිගමුවේ ඥාණදීප ධර්ම දේශකයාණන් වහන්සේයි. ඒ දේශනාව අහලා පැහැදුණ අපේ අය ඊළඟ දේශනය පැවැත්වුණ ඩැංඩිනොං පන්සලට එනකොට හොඳට බඩගිනි වෙලයි උන්නෙ:

පහුවදා දවස මෙල්බර්න් වල ඉන්න බෞද්ධයින්ට විශේෂ දවසක් වුණා. පන්සල් වල සංවිධානය කරලා තිබුණ පින්කම් වාගෙම කීස්බරෝ ධම්ම සරණ විහාරයේ නායක ස්වාමීන් වහන්සේ වන රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති ගරු නා ඔටුන්නේ විජිත ස්වාමීන් වහන්සේට ඕස්ට්‍රේලියාවේ ප්‍රධාන සංඝනායක තනතුර පිදුව උත්සවය විහාරස්ථානයේදී ඉහළින්ම පැවැත්වුණා. ඒ උත්සවයේදී ශාස්ත්‍රපති උඩහේනේ සීලරත්න හිමියන්ගේ මූලිකත්වයෙන් සම්බුද්ධ ජයන්තිය වෙනුවෙන් නිකුත් කෙරුණ වෙසක් කළාපය එළි දැක්වුණ එක අපේ සැදැහැවත් අයට අලුත්ම අත්දැකීමක් වුණා. ඉන් පස්සේ ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෝ එයාලගේ පවුල්වල උදවියත් එක්ක ඉදිරිපත් කරපු භක්ති ගීත ගායනයේ වෙනදාටත් වඩා ශාන්ත බවක් පෙණුනා. විහාරයේ තොරණ විවෘත කෙරුනේ ඊට පස්සෙයි.

බෙරික් වල ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයේ වෙසක් සැරසිළිත් හරි අපූරුවට කරලා තිබුණා. මුළු වත්ත පිරෙන්න ළමයි, තරුණ උදවිය එකතු වෙලා අටපට්ටම් කූඩු, නෙළුම් මල් කූඩු හදලා තිබුණා. ඒ වගේම පුරුදු විදියට ලොකු කූඩුවකුත් හදලා තිබුණා. ඒ අතරේ සර්වඥ ධාතුන් වහන්සේ ප්‍රදර්ශනයකුත් සංවිධානය කරලා තිබුණා.



අපේ තුන්දෙනාත් ඔය තැන්වල වෙසක් වන්දනාවේ ගියාට අනික් පන්සල් වලට යන්න වෙලාවක් ඉතුරු වුණේ නෑ. ඒත් ඒ අයට මේ ගැන ලියන්න, කියන්න දේවල් නම් ඕන තරම් තිබුණා. පන් ලියන්න පටන් ගත්තා.

"වෙසක් දෙසතිය පුරාවට මෙල්බර්න් නුවර පැවැත්වීමට යෙදුණා වූ සියළු බොදු වත් පිළිවෙත් සඳහා ඇප කැප වී මූලිකත්වය ගෙන කටයුතු කළ සියළු ස්වාමීන් වහන්සේලා මුලින්ම සිහිපත් කළයුතු වේ. අති පූජ්‍ය නාඔටුන්නේ විජිත සංඝනායක මාහිමිපාණන් ප්‍රමුඛ කීස්බරෝ ධම්මසරණ විහාරස්ථානයේ ශාස්ත්‍රපති පූජ්‍යපාද අකරවිට සංඝානන්ද නායක ස්වාමීන්වහන්සේ ප්‍රමුඛ ඩැංඩිනොං ධම්මදීප භාවනා මධ්‍යස්ථානයේ, ශාස්ත්‍රපති පූජ්‍යපාද පල්ලේවෙල දේව රක්ඛිත ස්වාමී-න් වහන්සේ ප්‍රමුඛ රොක් බෑන්ක් පාරමිතා බෞද්ධ මධ්‍යස්ථානයේ, ශාස්ත්‍රපති ත්‍රිපිටකාචාර්ය පූජ්‍යපාද දිගාමඩුල්ලේ විමලානන්ද ස්වාමීන් පූජ්‍ය කෝට්ටේ සන්නින්ද්‍රිය ස්වාමීන් වහන්සේ ප්‍රමුඛ යුරෝක් දහම් වහන්සේ ඇතුලු බෙරික් ශාක්‍යමුණි සම්බුද්ධ විහාරයේ, නිකේතනයේ සහ පූජ්‍ය හොරොව්පතානේ සතින්ද්‍රිය ස්වාමීන්වහන්සේ ඇතුළු කැම්බර්ෆීල්ඩ් හි සමාධි බෞද්ධ විහාරයේ වැඩ වසනා අන් සියළු හිමිවරුන් හා දයක කාරකාදීන් මාස ගණනාවක් තිස්සේ වෙහෙසෙමින් මේ කරගන්නා ලද්දේ විශාල පුණ්‍ය කර්මයකි. නාමිකව මෙහිදී මග හැරී ගියද අනෙකුත් බෞද්ධ පූජ්‍යස්ථාන පිළිබඳව ද සඳහන් කළ යුතුව ඇත්තේ එයමයි.

පළමු වතාවට "ඔස් ඕඩියෝ විෂුවල් ආර්ට් ඇසෝසේෂන්" වෙතින් ඉදිරිපත් කෙරුණා වූ භක්ති ගී


# MIGRATE TO AUSTRALIA

## MULTINATIONAL MIGRATION SERVICES & AUSTRALIAN MIGRATION SERVICES

The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

**ONSHORE**

- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

**OFFSHORE**

- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students

"EXPERIENCE THE DIFFERENCE"

Affordable fees & easy payment terms

Meet our qualified consultants with **years of experience** who can deliver the **results**

Senior Migration Consultants:

**Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986**

Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.

Consultation by Appointment only

Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.

For More Details or Free Online Assesment Visit Our Website

**www.multinational.com.au**

E-mail : info@multinational.com.au

MIA MEMBER OF MIGRATION INSTITUTE OF AUSTRALIA

MIGRATION AGENT REGISTERED mara.com.au REGISTRATION NUMBER 0320696